# ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
## ஸ்ரீ லங்கா நிருவாக சேவைச் சங்கம்
## SRI LANKA ADMINISTRATIVE SERVICE ASSOCIATION


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | SASA/2022/A/33 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.05.10 |

**නියෝජ්‍ය පොලිස්පති**
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව

**<u>ගාලුමුවදොර පිටිය සහ අරලියගහ මන්දිරය අසල සාමකාමී ලෙස සිදුකල විරෝධතාවට ප්‍රහාර එල්ල කිරීමට  වගකිව යුතු පාර්ශවවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම.</u>**

ඊයේ (2022-05-09) දින අරලිය ගහ මන්දිරයට ඒකරාශී වූ පිරිසක් ඒ ඉදිරිපිට හා ගාලු මුවදොර සාමකාමී විරෝධතා දක්වමින් සිටි මහජනතාව ඉලක්ක කොට ගෙන දියත් කරන ලද ම්ලේච්ඡ ප්‍රහාරය ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකිමු. විශේෂයෙන්ම හදිසි නීතිය ක්‍රියාත්මක කර ඇති අවස්ථාවකදී සාමකාමී නිරායුධ විරෝධතාවක නිරත වූ මහජනයා වෙත මෙවැනි ප්‍රහාරයක් එල්ල වීම වැලැක්වීම සඳහා රටේ ආරක්ෂක අංශ වලට නොහැකි වීම බරපතල තත්වයකි.

මේ සඳහා ආධාර හා අනුබල ලබා දීම මඟින් පැවති ආණ්ඩුව මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් කඩ කර ඇති බැවින් මෙම සිද්ධියට වගකිව යුතු පාර්ශව සඳහා දඬුවම් පමුණුවන ලෙස අප සංගමය තරයේ අවධාරණය කර සිටිමු. ඒ අනුව, මෙවැනි තත්ත්වයක් ඇති වීමට අනියමින් අනුබල දීම සම්බන්ධයෙන් හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් වගකීම භාරගත යුතු බව අවධාරණය කරන අතර මහජනයා ආරක්ෂා කිරීමේ වගකීම පැහැර හැරි මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ පොලිස්පතිවරයා සම්බන්ධයෙන් සාධාරණ පරික්ෂණ පවත්වා ඔවුන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන ලෙසට ඉල්ලා සිටිමු.

එසේම, හිටපු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු හා හිටපු රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත ඇතුළු මහජන නියෝජිතයන් පිරිසක් 2022-05-09 දින අරලියගහ මන්දිරයට පිරිස් කැඳවා ඔවුන් සංවිධානාත්මකව මහජනතාවට පහර දීම සඳහා පෙළඹවෙන ආකාරයේ ප්‍රකාශ නිකුත් කරන ලද බව නිරීක්ෂණය වේ. තව ද, එම අවස්ථාව සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන් විසින් අදාළ ආයතනවල සේවකයන් බලහත්කාරයෙන් කැඳවා ගෙන පැමිණ මෙම ම්ලේච්ඡ ක්‍රියාව මෙහෙයවීමට කටයුතු කර ඇති බවද නිරීක්ෂණය වේ. මීට අමතරව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම ක්‍රියාව සඳහා බන්ධනාගාර රැඳවියන් යොමු කර තිබූ  බවද සමාජ ජාල හරහා සංසරණය වූ වීඩියෝ දර්ශන නැරඹීමේදී නිරීක්ෂණය වේ.

ඒ අනුව මෙම ම්ලේච්ඡ ක්‍රියාවට සම්බන්ධ වූ සහ ආධාර අනුබල දුන් සියලු පාර්ශව සම්බන්ධයෙන් වහාම විධිමත් පරීක්ෂණ පවත්වා නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

**පදුල ශ්‍රී රෝහණ ද සිල්වා**
ගරු සභාපති

**ප්‍රදීප් ලක්ශාන්ත**
ගරු ලේකම්


**23 සී, සමූළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 05.** 23 சீ, சமிட் தொடர்மாடி,கெப்பிட்டிப்பொல மாவத்தை, கொழும்பு-05.
**23C, Summit Flats, Keppetipola Mw., Colombo 05.**
දුරකතනය/ தொலைபேசி/Telephone : 011 5766855 — ෆැක්ස්/தொலைநகல்/ Fax : 011 2058027
විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/ Email : sasa.execo@gmail.com — වෙබ් අඩවිය/இணையத்தளம்/ Web: www.sasa.lk